සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020(I)**

| | | |
|---|---|---|
| කාලය: පැය 03 | කළමනාකරණය හා සංවිධානය (20) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |

- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්නවලට සමාන ලකුණු හිමි වේ.

---

1. I. රාජ්‍ය අංශයේ කාර්ය සාධන කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීමේ අභියෝග සහ අවස්ථා සාකච්ඡා කරන්න. (ලකුණු 10)

   II. කාර්ය සාධන කළමනාකරණය මගින් රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණ සපයන්න. (ලකුණු 10)

2. I. "නව රාජ්‍ය කළමනාකරණය (NPM)" සංකල්පය රාජ්‍ය අංශයේ ආයතන කෙරෙහි බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 10)

   II. NPM ප්‍රතිසංස්කරණ සහ ඒවායේ ප්‍රතිඵල පිළිබඳ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළින් උදාහරණ සපයන්න. (ලකුණු 10)

3. I. රාජ්‍ය අංශයේ නායකත්වයේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 06)

   II. රාජ්‍ය සහ පෞද්ගලික අංශවල නායකත්ව ශෛලීන් සංසන්දනය කරන්න. (ලකුණු 07)

   III. ආයතනික කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා නායකත්වය කෙසේ ඉවහල් වන්නේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 07)

4. I. රාජ්‍ය අංශයේ ආයතනවල නිලධරයන්ගේ වෘත්තීයමය (Professionalism) බව ඉහළ නැංවීම හා සේවාලාභී තෘප්තිය වැඩි කිරීම සඳහා ආචාරධර්මවල (ethics) කාර්යභාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

   II. රාජ්‍ය අංශයේ සේවකයින් මුහුණ දිය හැකි බැඳියාවන් අතර ගැටුම් (conflict of interest) පිළිබඳ උදාහරණ සපයමින් ඒවා මගහරවා ගැනීම සඳහා ගත හැකි උපාය මාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5. I. "රාජ්‍ය අංශයේ සහයෝගී පාලනය (collaborative governance)" යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. සහයෝගී පාලනයේ ප්‍රතිලාභ සහ අභියෝග උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

6. I. රාජ්‍ය අංශයේ ආයතනවලට ඩිජිටල් පරිවර්තනයේ බලපෑම අගයමින් ඩිජිටල්කරණයේ වාසි සහ අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

II. මහජන සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා සිදුකර ඇති ඩිජිටල් මුලපිරීම් (Initiatives) පිළිබඳ උදාහරණ සපයන්න. (ලකුණු 10)

7. I. රාජ්‍ය අංශයේ කළමනාකරණයේ පාරදෘශ්‍යභාවයේ සහ වගවීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. පාරදෘශ්‍ය පියවරයන් සහ ඒවා මහජන විශ්වාසය වැඩිදියුණු කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණ සපයන්න. (ලකුණු 10)

8. I. රාජ්‍ය අංශයේ නවෝත්පාදන සංකල්පය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

II. රාජ්‍ය ආයතනවල නවෝත්පාදනයන් පෝෂණය කළ හැක්කේ කෙසේද යන්න සහ නව්‍ය භාවිතයන්හි ප්‍රතිලාභ මොනවාද යන්න පහදන්න. (ලකුණු 10)

**************